ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීම සහ ස්ථාවර නියෝග අංක **119(4)** ප්‍රකාරව රාජ්‍ය ගිණුම් කාරක සභාව සභාගත කළ වාර්තාවට අදාළව ගෙන ඇති ක්‍රියාමාර්ග

පාර්ලිමේන්තු ප්‍රකාශණ මාලා අංක **: 183**

ආයතනයේ නම **:** ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

| කාරක සභාව මගින් හඳුනාගත් අඩුපාඩු/ කාරක සභාව මගින් හඳුනාගත් නියමයන් | | අඩුපාඩු මග හරවා ගැනීමට ආයතනය ගෙන ඇති ක්‍රියාමාර්ග/ නිර්දේශ ක්‍රියාත්මක කිරීම/ වර්තමාන තත්ත්වය |
|---|---|---|
| 01 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි. | නියමිත කාලය තුළ විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා දීමට උපදෙස් දී ඇතත් සමහර ප්‍රායෝගික තත්වයන් තුළ එසේ කළ නොහැකිවන විට ඒ බව විගණන අධිකාරි වෙත ලිඛිතව දන්වා සාධාරණ කාලයක් ලබා ගැනීමට කටයුතු කොට ඇත. |
| 02 | 2016 මාර්තු 31 දිනැති අංක 2016(5) දරන මුදල් චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණය කර නියමිත දිනට අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | පාර්ලිමේන්තුවේ පවතින කටයුතුවල ස්වභාවයත් දෙපාර්තමේන්තු 9ක් පුරා විශාල ඒකක ප්‍රමාණයක් පුරා පැතිර තිබීමත් නිසා වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය පැවැතියත් නිශ්චිත කාලරාමුවක් තුළ අවසන් වාර්තාව ලබා දීමට ප්‍රායෝගික අපහසුකම් ඇත. එහෙත් 2022 වසර වනවිට විශාල වශයෙන් කාල පමාව අඩු වී ඇත. |
| 03 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා පිළිබඳව වන නිර්දේශද අනෙකුත් නිර්දේශද නියමිත කාල වකවානු තුළ ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉහත පිළිතුර හා බැඳේ. |
| 04 | 2016.12.29 දිනැති අංක 2016(30) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනයවීම් පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. | 2021 හා 2022 වසරයන්හි පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මතු වූ ප්‍රායෝගික ගැටළු මත ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට නොහැකි වී ඇතත් 2023 වසරේ දී මෙය ක්‍රියාවට නැංවීම සඳහා කමිටුවක් පත් කොට ඇත. |
| 05 | වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර නොතිබුණි. | වැඩ තහනම් කළ නිළධාරීන් තිදෙනාගෙන් එක් අයෙකු වාරික වශයෙන් ගෙවීම අරඹා ඇත. විශ්‍රාම ගිය නිළධාරින්ගෙන් එක් අයෙකුගෙන් අයකර ගැනීම 2023 පෙබරවාරි මස සිදුකළ හැක. අනෙක් අයගේ පාරිතෝෂික ගෙවීම තවමත් සිදු කොට නැත. |
| 06 | සමාලෝචිත වර්ෂය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු කාර්ය සාධන වාර්තා නියමිත දිනට ඉදිරිපත් කර නොතිබුණි. | නියමිත දිනට සභාගත කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. |
| 07 | 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සංවර්ධනය වෙනුවෙන්ම වෙන්වූ කාර්යාලයක් 2020.01.07 දින ස්ථාපනය කළ අතර පාර්ලිමේන්තු ක්‍රියාදාමයට අවශ්‍ය ධාරිතා සංවර්ධනය පිණිස මානව සම්පත් සංවර්ධන සැලැස්මක් දැනටමත් සකස් කර ඇත. |

| | | |
|---|---|---|
| 08 | සකස් කරන ලද මානව සම්පත් සැලැස්ම මගින් එක් සේවකයෙකු සඳහා අවම වශයෙන් වර්ෂයකට පැය 12ක අතිරේක පුහුණුවක් නියම කර නොතිබුණි. | සෑම සේවකයෙකුගේම පුහුණු අවශ්‍යතා ආවරණය වන පරිදි ප්‍රමාණවත් පුහුණු කාලයක් වෙන් කොට ඇත. |
| 09 | සමසථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි. ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය යටත්ව මතයක් විය. | සමස්ථ කාර්ය මණ්ඩලයම ආවරණය වන පරිදි ඒ ඒ තනතුර සඳහා රැකියා විස්තර සකසා, හැකි සෑම තනතුරක් සඳහාම අදාළ රාජකාරී ලැයිස්තු ඒ ඒ නිලධාරින් වෙත ලබා දී ඇති අතර ඒ තුළින් ක්‍රියාකාරී සැලසුම තුළ අනෙකුත් කාර්යයන් සිදු කිරීමට මෙහෙයවීමත්, කාර්යසාධනය ඇගයීමත් සිදු කරනු ලබයි. |

පාර්ලිමේන්තුවේ මහ ලේකම්